**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් III ශ්‍රේණියට පත් කිරීම- 2024**

2020.07.24 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7.5 (අ) වගන්තියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද, විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කිරීම සඳහා වන විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඔබ කාර්යාලයේ /ආයතනයේ සේවය කරන සියලුම තාක්‍ෂණ සේවයේ (සැලසුම් ශිල්පී) පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා මෙය යොමු කරන්නේ නම් කෘතඥ වෙමි.

03. මෙම විභාගය පහත පරිදි පවත්වනු ලැබේ.

**03.1** විභාගය පිළිබඳ විස්තර:-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන විභාගය | පැය 03 | 100 | 40% |

**03.2** විභාගය සඳහා වන විෂය නිර්දේශය

- ගොඩනැගිලි, වාරිමාර්ග, විදුලි, යාන්ත්‍රික, ජල සම්පාදන හා මාර්ග ආදී විෂය ක්ෂේත්‍රයන්ට අදාළ සැලසුම් ඇඳීමේ දැනුම පරීක්‍ෂා කිරීම.
- මිනුම් මට්ටම් ඇඳීම පිළිබඳව පරීක්‍ෂා කර බැලීම.

**04.** අයදුම් කිරීමේ ක්‍රමය:-

4.1 **අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්‍ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් පළමු පිටපතටද අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.**

**4.2** සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024.06.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බස්නාහිර පළාත. අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියට (වසරක/ දෙවසරක) බඳවා ගත් නිලධාරීන් III ශ්‍රේණියට පත් කිරීම යන්න" පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

4.3 දෙවන වර විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා විභාග ගාස්තුව රු 1200/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියට (වසරක/ දෙවසරක) බඳවා ගත් නිලධාරීන් III ශ්‍රේණියට පත් කිරීම සඳහා වන විභාගය සඳහා මුදල් ගෙවිය යුත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පමණක් හා ඉහතින් දක්වා ඇති වැය ශීර්ෂයට පමණක් වන අතර, වෙනත් ආයතන හෝ මාර්ගග. ක්‍රමය ඔස්සේ හෝ මුදල් ගෙවිය නොහැකි අතර එසේ මුදල් ගෙවීම් පිළිබඳ කරනු ලබන පැමිණිලි සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

4.4 සෑම අයදුම්පතක් සමඟම පුහුණු ශ්‍රේණියට අදාල නිලධාරින්ගේ පහත සඳහන් ලිපිලේඛන වල සහතික කරන ලද පිටපත් ද අමුණා එවිය යුතුය.

- පුහුණු පත්වීම් ලිපිය
- වැඩ භාරගත් ලිපිය
- නිලධාරියා විසින් සම්පූර්ණ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සැලසුම් ශිල්පී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7.2.1.2 (අ) හි සඳහන් වෘත්තීය සුදුසුකමට අදාළ සහතිකය
- පුහුණු කාලය තුල නිලධාරියා ලබාගත් නිවාඩු පිළිබඳ විස්තර

4.5 අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 07 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, ඇතුළත්ව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

05. විභාගය පවත්වන දිනයන් පසුව දැනුම් දෙනු ලැබේ.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2024.06. 18

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් III ශ්‍රේණියට පත් කිරීමේ විභාගය - 2024

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය ....................................................................

(මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E
[ ]

01 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -....................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
....................................................................
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-....................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | | | ]

02 2.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ....................................................................
....................................................................

2.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්): ....................................................................
....................................................................

2.3 විභාග ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය:-
i. සිංහලෙන්/දෙමළෙන්
....................................................................
....................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:- ....................................................................
....................................................................

2.4 දුරකථන අංකය :

ස්ථාවර: [ | | | | | | | | | | ] ජංගම: [ | | | | | | | | | | ]

❖ **විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. (පසුව කරනු ලබන පැමිණිලි භාරගනු නොලැබේ)**

03 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී [ ] පුරුෂ [ ]

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ -1
ගම්පහ - 2
කළුතර - 3
[ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය-....................................................................

3.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව-....................................................................

04 4.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක [ ] අවිවාහක [ ]

4.2 උපන් දිනය වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු: [ | ] මාස: [ | ] දින: [ | ]

05 සේවා විස්තර -

- .පුහුණු කිරීමේ ශ්‍රේණියට පත් වීම් ලද දිනය:-...............................................................................
- .පත්වීම් ලිපියේ අංකය හා දිනය :- ...........................................................................................
- .ප්‍රධාන ලේකම් මගින් වැඩ භාර ගන්නා ලද දිනය :-.......................................................................
- --------------- දිනට අදාළ ශ්‍රේණියේ සේවා කාලය :-......................................................................

06. මීට පෙර මෙම විභාගය සඳහා පෙනී සිට ඇතිද ? එසේ නම් පෙනී සිට ඇති වාර ගණන සහ එම දිනයන් සඳහන් කරන්න.

.............................................................................................................................................

<u>එක් වරකට වඩා</u> විභාගය සඳහා පෙනී සිට ඇති අයදුම්කරුවන් විසින් රු.1200.00 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය.

ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..................................................................................

විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය - .............................................................................................

දිනය - ...........................................................................................................................................

| ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න |
|---|

07. <u>අයදුම්කාරියගේ/අයදුම්කරුගේ සහතිකය</u>

.............................................................................................................................................

................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට මා නුසුදුස්සෙකු බව විභාගයට කලින් ,විභාගය පැවැත්වෙන අතරතුර හෝ ඊට පසුව සොයා ගනු ලැබුවහොත් ,මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම වෙනුවෙන් ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

දිනය ........................ ..................................................

අයදුම්කරුගේ අත්සන

**08.** <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>

මගේ කාර්යාලයේ ඇති නිල වාර්තා වල සඳහන් තොරතුරු අනුව ………………………………………… මයා /මිය/ මෙනවිය විසින් ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් , ඔහුට /ඇයට මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇති බවත්, සහතික කරමි.

…………………………  …………………………………………………………

දිනය  ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

**09.** <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි./නොවෙමි.

…………………………  ………………………………………………

දිනය  දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

**10.** <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි./නොවෙමි.

………………………………………  …………………………………………………………

දිනය  අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිලමුද්‍රාව

**11.** <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි./නොවෙමි.

………………………………………  …………………………………………………………

දිනය  ප්‍රධාන ලේකම්ගේ අත්සන හා නිලමුද්‍රාව